සංඛ්‍යා පද්ධති

පුනරීක්ෂණ අභ්‍යාස

1)

I. සංකේත දෙකක් පමණක් භාවිතාවන සංඛ්‍යා පද්ධතිය කුමක් ද? එම සංඛ්‍යා පද්ධතියේ පාදය හා භාවිතාවන සංකේත නම් කරන්න.

II. අෂ්ටමය සංඛ්‍යා පද්ධතියේ පාදය කුමක්ද? භාවිතාවන සංකේත මොනවා ද?

III. අප එදිනෙදා ගණනය කිරීම් සඳහා භාවිතා කරන සංඛ්‍යා පද්ධතිය නම් කරන්න. එහි පාදය සඳහන් කර සංකේත ලියා දක්වන්න.

IV. එකිනෙකට වෙනස් සංකේත දහසයක් භාවිතාවන සංඛ්‍යා පද්ධතිය කුමක් ද? එම සංඛ්‍යා පද්ධතියේ පාදය හා භාවිතාවන සංකේත නම් කරන්න.

2) පහත දැක්වෙන සංඛ්‍යා ගණක රාමුවක නිරූපණය කරන්න.

I.	475_{10}	VI.	10111_2
II.	869_{10}	VII.	101010_2
III.	681_{10}	VIII.	11111_2
IV.	1005_{10}	IX.	101101_2
V.	4723_{10}	X.	1101011_2

3) ඉහත (2) හි ගණක රාමුවල නිරූපණය කළ සංඛ්‍යා විහිදුවා ලියන්න.

4) පහත දැක්වෙන දශමය සංඛ්‍යා ද්වීමය සංඛ්‍යා බවට පරිවර්ථනය කරන්න.

I.	475	VI.	256
II.	869	VII.	512
III.	681	VIII.	760
IV.	100	IX.	920
V.	384	X.	128

5) පහත දැක්වෙන ද්වීමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට පරිවර්ථනය කරන්න.

I.	10111_2	VI.	110010_2
II.	101010_2	VII.	1010101_2
III.	11111_2	VIII.	111110_2
IV.	101101_2	IX.	111001_2
V.	1101011_2	X.	110011_2